**ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය - 2016**

-----------------------------------------------

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතේ 24 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

-----------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

--------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

## 2.1 මතය ව්‍යාචනය

------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

මණ්ඩලය දිගින් දිගටම අලාභ ලැබීම මත ශුද්ධ වත්කම් විශාල ලෙස බාදනයට ලක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ශුද්ධ වත්කම් රු.20,851,282,909 ක සෘණ අගයක් ගෙන තිබූ අතර, ඒ හේතුවෙන් භාණ්ඩාගාරයේ හෝ රජයේ මූල්‍ය සහායක් නොමැතිව ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාම පිළිබඳව අවිනිශ්චිතතාවයන් ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය තත්ත්වය විග්‍රහ කිරීමේදී 2011 සිට 2015 දක්වා කාලය තුළ ජංගම වගකීම් ආවරණය කරගැනීම සඳහා ඇති ජංගම වත්කම් ප්‍රමාණය මුළු ජංගම වගකීම්වලින් සාමාන්‍යය සියයට 32 ක පහළ මට්ටමක පැවති අතර 2016 වර්ෂයේදී මෙම මට්ටම සියයට 49 ක් ලෙස පැවතුණි. ගෙවියයුතු මුදල් නියමිත පරිදි නොගෙවීම, අයකර ගතයුතු මුදල් අයකර ගැනීමට කටයුතු නොකිරීම හා දීර්ඝ කාලීනව නිරවුල් නොවී ඉදිරියට එමින් පවතින ශේෂ මෙම තත්ත්වය ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

#### (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

(i) ප්‍රමිතයේ 55 ඡේදය ප්‍රකාරව වත්කම් ප්‍රයෝජනයට ගතහැකි තත්ත්වයට පත්කළ අවස්ථාවේ සිට ඵලදායී ජීවිත කාලය පුරා ක්‍රමානුකූල පදනමකින් ක්ෂය කළ යුතු නමුත් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන භාවිතයට ගත් රු. 81,415,892ක් වටිනා වත්කම් වෙනුවෙන් ක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ii) මණ්ඩලයේ බස්රථ ඇණියෙන් සමාලෝචිත වර්ෂය වන විට වටිනාකම රු.1,367,754,792 ක බස් රථ ගර්හිත කර තිබුණු අතර, එම බස්රථවල ක්ෂය වටිනාකම රු. 1,370,972,541ක් වී තිබුණි. මෙම බස් රථ භාවිතයෙන් ඉවත් කර තිබුණද, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි. ගර්හිත බස්වල පිරිවැය ඉක්මවා රු.3,217,749 ක් ක්ෂය වෙන්කිරීම් සිදුකර තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේදී රු.1,041,195 ක් වටිනා වාහන ගර්හිත කර තිබුණද, එම ගර්හිත වාහන වෙනුවෙන් රු.520,385 ක් ක්ෂය වෙන්කිරීම් සිදුකර තිබූ අතර එම වාහන ඉවත් කිරීමට කටයුතු නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්ථාවර වත්කම් යටතේ දක්වා තිබුණි.

(iv) ප්‍රමිතයේ 58 ඡේදය ප්‍රකාරව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම වෙන් වෙන්ව හඳුනා ගෙන ගිණුම්ගත කළයුතු වුවද ප්‍රමිතයට පටහැනි ලෙස රු.319,799,318 ක් වූ ඉඩම් හා ගොඩනැගිලිවල මුළු වටිනාකමින් සියයට 50 ක් ගොඩනැගිලි වටිනාකම ලෙස උපකල්පනය කර, සියයට 2.5 බැගින් ක්ෂය ගණනය කර තිබුණු අතර, 2016 දෙසැම්බර් 31 වන විට ගොඩනැගිලිවල පිරිවැය ඉක්මවා රු. 1,005,499 ක් ක්ෂය කර තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 17**

(i) ප්‍රමිතයේ 31 (ආ) ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල කල්බදු වගකීම දැක්වීමේදී එම කල්බදු වත්කම්වල සාධාරණ අගය හෝ ගෙවීමට ඇති කල්බදු වාරිකවල වර්තමාන අගය යන දෙකින් අඩු අගය දැක්විය යුතු වුවද, මණ්ඩලය විසින් කල්බදු වගකීම පිරිවැය මතද, පොළී ප්‍රමාණය වාරික ගණනේ එකතු ක්‍රමය(Sum of digit method) මතද ගණනය කර රු.7,383,195,074 ක් ලෙස කල්බදු වගකීම යටතේ දක්වා තිබුණි.

(ii) කල්බදු සම්බන්ධයෙන් පහත සඳහන් හෙළිදරව් කිරීම් සිදුකර නොතිබුණි.

- කාලපරිච්ඡේදය අවසානයට අවම කල්බදු වාරිකය හා එහි වර්තමාන අගය සැසඳීමක්.
- වසරකට නොඅඩු කාලයකට, වසරකට වැඩි සහ වසර 05 කට අඩු සහ වසර 05 කට වැඩි කාලපරිච්ඡේදයන්ට අදාළව ගිණුම් කාලපරිච්ඡේදය අවසානයට වූ අනාගත කල්බදු වාරිකවල එකතුව හා ඒවායේ වර්තමාන අගයේ එකතුව.

**(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19**

ප්‍රමිතයේ 57 ජේදය ප්‍රකාරව අර්ථ දක්වන ලද පශ්චාත් සේවක ප්‍රතිලාභ වගකීම ගණනය කිරීමේදී පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය භාවිතා කළ යුතු වුවත් ඊට පටහැනි ලෙස එක් එක් ශ්‍රේණියේ මධ්‍යන වැටුපට ජීවන වියදම් දීමනාව හා අතිරේක දීමනා එකතු කර නිලධාරීන් ගණනින් වැඩි කිරීම මගින් මුළු පාරිතෝෂික දීමනා වෙන්කිරීම් ගණනය කර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ආයතනය විසින් පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබූ අතර 2015 වර්ෂයේ මිලට ගෙන තිබුණු රු. 9,510,486 ක් වටිනා මෘදුකාංග සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.2,377,621 ක් වූ ක්‍රමක්ෂය ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම බස්රථ නැවතුම්පළ කාර්යාලයෙහි, කඩ කුලී ආදායම විදුලිය හා ජලබිල්පත් ගාස්තු මුදල් පදනම මත ගිණුම්ගත කිරීම හේතුවෙන්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු.3,199,955 ක හිඟ කඩකුලී ආදායම හා රු.773,967 ක් වූ හිඟ විදුලිය හා ජල බිල්පත් ගාස්තු ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එකතුව රු.147,965ක් වූ බැංකු ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2016 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලීය ගබඩා සමීක්ෂණ වාර්තාව අනුව වටිනාකම රු. 1,107,267 ක් වූ මගී ටිකට් පොත්, ජොෂ්ඨ පුරවැසි කූපන්පත් ඇතුළුව ගබඩා අයිතම් 11 ක්, පාවිච්චියට ගත නොහැකි වූ අතර එහි එම වටිනාකම තොගයෙන් ඉවත් කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් තොග අගය එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ජාතික ගමනාගමන කොමිෂන් සභාවෙන් උඩුගම ඩිපෝවට අදාළව බැංකු ජංගම ගිණුම් වෙත සෘජුව ලැබී තිබුණු සිසු සැරිය හා නිසි සැරිය ආදායම පිළිවෙලින් රු. 378,072 ක් හා රු. 793,164ක් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) හොරොව්පතාන නව ඩිපෝවේ ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් රු.32,436,777 ක් වැය කර තිබූ අතර එය 2012 ජූනි 11 දින සිට භාවිතයට ගෙන තිබියදී එම වැය කරන ලද මුදල තවදුරටත් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. ඒ අනුව ගොඩනැගිලි ක්ෂය වටිනාකමද රු.810,919 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.5 අවිනිශ්චිත ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.390,910 ක අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

--------------------------------------

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත්කර නොතිබීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | ගිණුම් විෂයය | වටිනාකම (රු.) | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| (i) | **ක්‍රියාකාරී නොවන ගිණුම්** | | |
| | **- හර** | 9,935,459,128 | කාල විශ්ලේෂණ හා ශේෂ සනාථ ලිපි. |
| | **- බැර** | 26,054,954,882 | |
| (ii) | ලංකා බැංකුවේ ස්ථාවර තැන්පතු. | 6,905,000 | තැන්පත් සහතික. |
| (iii) | මුදල් ශේෂය. | 1,856,558,905 | ඩිපෝ වශයෙන් වෙන්කළ විස්තරාත්මක උපලේඛන හා ශේෂ සනාථන |
| (iv) | බැංකු අයිරා | 889,251,471 | |
| (v) | වෙළඳ ණය හිමියෝ | 2,434,887,483 | |
| (vi) | අනෙකුත් ණය හිමියෝ | 137,398,234 | |
| (vii) | කැෂියර් හිඟ ශේෂය | 34,776,498 | |
| (viii) | කොන්දොස්තර අක්‍රමිකතා ශේෂය | 11,595,695 | |
| (ix) | විවිධ ණයගැතියෝ | 101,155,750 | විස්තරාත්මක උපලේඛන කාල විශ්ලේෂණ හා ශේෂ සනාථන |
| (x) | ලැබිය යුතු ආදායම | 233,785,840 | |
| (xi) | වෙළඳ ණය ගැති ශේෂය | 19,632,110 | උපලේඛන |
| (xii) | ඉතිරි කිරීමේ ගිණුම් | 31,297,381 | ගිණුම් 11 ක් සඳහා ශේෂ සනාථ ලිපි |
| (xiii) | ඉඩම් ගොඩනැගිලි | 319,799,318 | වත්කම් ලේඛනය, විස්තරාත්මක උප ලේඛනය හා තක්සේරු වාර්තා |
| (xiv) | තොග | 817,776,589 | විස්තරාත්මක තොග වාර්තා |
| (xv) | අවලංගු කළ චෙක්පත් | 7,138,279 | විස්තරාත්මක උපලේඛන හා කාල විශ්ලේෂණ |
| (xvi) | තෙවැනි පාර්ශව සඳහා ගෙවීම් (වැටුප් අවකරණ) | 49,013,863 | |

**2.2.7 පැහැදිලි නොකළ වෙනස්කම්**

2016 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව ගෙවිය යුතු අර්ථ සාධක අරමුදල් දායක මුදල හා අධිභාර මුදල එකතුව රු.3,720,781,715 ක් වුවද සේවක අර්ථසාධක අරමුදල අනුව අයවිය යුතු ශේෂය රු.5,343,474,711 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු ශේෂයෙහි රු.1,622,692,996 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම බස්රට නැවතුම්පළ කාර්යාලයෙහි හිඟ කඩකුලී ආදායම ලෙස 2009 වර්ෂයේ සිට රු. 1,863,414 ක් ද 2014 වර්ෂයේ සිට රු.5,368,009 ක මුදලක්ද අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසන් වන විටද ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාලයේ අයවිය යුතු බලපත්‍ර ආදායම රු. 142,466,102 ක් වූ අතර ඉන් රු. 12,783,486 ක් වසරකට වැඩි වී තිබුණි. මණ්ඩලය මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මිලදී ගැණුම් අත්තිකාරම් ගිණුමෙහි නොපියවූ ශේෂ එකතුව රු.1,635,847,558 කින් රු. 1,633,859,392 ක් හෙවත් සියයට 99 ක් වසර 01 සිට වසර 03ක කාල පරාසයක් තුල ලබා දී නොපියවූ අත්තිකාරම් වන අතර සියයට 40 ක් එනම් රු. 649,682,474 ක් වසර 3 ට වැඩි කාලයක් තුළ නිරවුල් වී නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී බදුල්ල හා බණ්ඩාරවෙල ඩිපෝවන්හි ලැබිය යුතු ආදායම් ශේෂයන් පිළිවෙලින් රු. 2,917,799 ක් හා රු.2,415,070ක් පැවති අතර, මෙම මුදල් කාලයක් තුල අය නොවී පැවතුණි.

(ඉ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ රු. 233,785,840 ක් වූ ලැබිය යුතු ආදායම් ශේෂය තුළ ඇතුළත් රු.187,514,112 ක ලැබිය යුතු අර්ථසාධක අරමුදල් ණය අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුලදී කටයුතු කර නොතිබුණි.

(ඊ) කොළඹ ප්‍රාදේශීය කාර්යාලය, බලංගොඩ හා අවිස්සාවේල්ල ඩිපෝවන්හි එකතුව රු. 29,109,121 ක් ද ලැබිය යුතු ආදායම් වසර 05 ත් 10 ත් අතර කාලයක සිට හිඟව පැවතුණි.

(උ) 2012 වර්ෂයට පෙර සිට පැවත එන දඹුල්ල හා මොණරාගල ඩිපෝවන්හි ලැබිය යුතු ආදායම් පිළිවෙලින් රු.3,609,145 ක් හා රු.11,076,232 ක් නිරවුල් නොවී පැවතුණි.

**2.4 නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 ඡේදය | සමාලෝචිත වර්ෂයේ, දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පතුවල හා භාණ්ඩාගාර බිල්පත් වල එකතුව රු. 479,094,484 ක් ආයෝජනය කර තිබුණද ඒ සඳහා මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය හා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. |
| (ආ) | 1981 අංක 26 දරන පනතින් සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත 16 වගන්තිය | සෑම මාසයකම දායක මුදල් ඊලඟ මාසයේ අවසන් දිනට පෙර සේවක අර්ථසාධක අරමුදල වෙත බැර කල යුතු වුවද ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල වල නිලධාරීන් වෙනුවෙන් දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා 2016 දෙසැම්බර් 31 දිනට රු. 3,576,839,351 ක ගෙවිය යුතු ශේෂයන් පැවතුනි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| | (i) මුදල් රෙගුලාසි 395 (ආ) | සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලය මගින් පවත්වාගෙන යන බැංකු ගිණුම් 62 කට අදාළ බැංකු සැසඳුම් වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 395 (ඉ) | බැංකු ගිණුම් 03ක එකතුව රු.9,179,791 ක් වූ නිකුත් කළ නමුත් ඉදිරිපත් නොවූ චෙක්පත් හා තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 395 (ඌ) | නිලධාරීන්ට රාජකාරී පැවරීමේදී මුදල් පොත පිළියෙල කිරීමට සම්බන්ධ නොවූ පුද්ගලයෙකුට බැංකු සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීමේ කාර්යය පැවරිය යුතු වුවත්, මණ්ඩලයේ සියලුම බැංකු ගිණුම්වල බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ කාර්යය මුදල් පොත පවත්වාගෙන යනු ලබන නිලධාරීන් හට පවරා තිබුණි. |
| | (iv) මුදල් රෙගුලාසි 396(ඇ) | බැංකු ගිණුම් 14 කට අදාළ නිකුත් කළ දින සිට මාස 06 ක කාලයක් ඉකුත් වී බැංකුවට ඉදිරිපත් නොකළ රු.5,029,620ක් වූ චෙක්පත් 67 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය සහ අත්පොත | සමාලෝචිත වර්ෂයේදී රු. 775,655,613 ක් වටිනා ටයර් ප්‍රසම්පාදනය.<br>------------------------------------------------------------ |
| | (i) 4.2.3 වගන්තිය | සම්පූර්ණ ප්‍රසම්පාදන ක්‍රියාවලිය ඇතුලත් වන පරිදි ප්‍රසම්පාදන කාල සටහන සකස් කර නොතිබුණි. |
| | (ii) 5.3.11 වගන්තිය | ලංසු වලංගු කාලය අවසන් වූ දින සිට තවත් දින 14 ක් ලංසු සුරක්‍ෂණයේ කාලය වැඩිවිය යුතු වුවත් එය ඉටු වී නොතිබුණි. |
| | (iii) 5.4.8 වගන්තිය | භාණ්ඩ සැපයීම නිම කිරීමට නියමිත දිනෙන් ඔබ්බට දින 28 ක් දක්වා කාර්යය සාධන සුරක්‍ෂණය වලංගු විය යුතු වුවත් එය ඉටු වී නොතිබුණි. |
| | (iv) 6.3.3 වගන්තිය | ලංසු විවෘත කිරීමේ කාර්යය පටිපාටිය අනුව ලංසු සුරක්‍ෂණ සහතිකයේ කෙටි අත්සන තැබීම ලංසු විවෘත කිරීමේ කමිටු සියලු සාමාජිකයින් විසින් කලයුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. |
| | (v) 7.4 වගන්තිය | ලංසුවෙහි වලංගු කාලයෙන් සියයට පනහක කාලයක් ඇතුලත තාක්‍ෂණික ඇගයීම් කමිටුව විසින් ලංසු ඇගයීම් වාර්තාව සම්පූර්ණ කලයුතු වුවත් එසේ සිදුකර නොතිබීම. |
| | | සමාලෝචිත වර්ෂයේදී රු. 52,759,716ක් වටිනා දුනුකොළ ප්‍රසම්පාදනය.<br>------------------------------------------------------------ |
| | (i) 5.3.2 වගන්තිය | ප්‍රසම්පාදන දැන්වීමේ ඇතුළත් කළයුතු මූලිකව වැදගත් වන කරුණු ඇතුළත් කර නොතිබුණි. |
| | (ii) 5.4.8 වගන්තිය | භාණ්ඩ සැපයීම නිම කිරීමට නියමිත දිනෙන් ඔබ්බට දින 28 ක් දක්වා කාර්යය සාධන සුරක්‍ෂණය වලංගු විය යුතු වුවත් එය ඉටු වී නොතිබුණි. |
| (ඉ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානයට රු. 29,063,501,009 ක් වටිනා දේපළ, පිරියත හා උපකරණ මණ්ඩලය සතු වුවද එම සියලු වත්කම් ඇතුලත් වන පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඊ) | මධ්‍යම බස් නැවතුම්පළ කඩ කාමර බදු ගිවිසුම් අංක 05,14,08,09 වගන්ති | ජල බිල්පත්,විදුලි බිල්පත්,නියමිත පරිදි ගෙවා නොතිබීම. |

(උ) මණ්ඩලය හා සියට් සමාගම සමඟ එළඹි ටයර් ප්‍රසම්පාදනය සම්බන්ධ ගිවිසුම

| | |
|---|---|
| (i) කොන්දේසි අංක 7.2 | ඇනවුම් කර සතියක් ඇතුලත භාර දිය යුතු වුවත්, එසේ භාර දී නොතිබුණු ටයර්වල ප්‍රමාද කාලය දින 16 සිට දින 180ක් දක්වා වූ කාල පරාසයක තිබුණි. |
| (ii) කොන්දේසි අංක 8 | කොන්දේසිය පරිදි ඇණවුම් කළ භාණ්ඩ නියමිත පරිදි ලබා නොදීම නිසා පමා පොලිය අයකර නොතිබුණි. ඒ අනුව අංක 902 වවුචරය මගින් ඇනවුම් 04 ක් සඳහා රු. 734,751 ක පමා පොලී අයකරගෙන නොතිබුණි. |
| (iii) කොන්දේසි අංක 10.4 / 10.5 | නව ටයර් ක්‍රියාකාරීත්ව වාර්තා අනුව ධාවනය කල යුතු කිලෝමීටර් ගණනට අඩුවෙන් ධාවනය කර තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් කොන්දේසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 632,619,173 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.751,260,743 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.118,641,570 කින් අඩු වී තිබුණි. මණ්ඩලයේ ආදායම රු. 3,638,684,574 කින් වැඩි වී රජයේ ප්‍රදාන රු. 342,896,380 කින් වැඩිවීම ද, ඉහත ඌනතාවය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මණ්ඩලයේ ඌනතාවය ක්‍රමයෙන් අඩු වී තිබුණි. සේවක පාරිශ්‍රමික සහ ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් සැලකිල්ලට ගැනීමේදී මණ්ඩලයේ දායකත්වය 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී වර්ධනය වී තිබූ අතර 2013 වර්ෂයේ දී රු. 12,709,377,743 ක් වූ දායකත්වය 2016 වර්ෂයේ දී රු. 19,538,760,465 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

2016 වර්ෂයේ මණ්ඩලයේ අරමුණු ඉටු කිරීම සම්බන්ධයෙන් සංයුක්ත සැලැස්මට අනුව සකස් කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම, ප්‍රගති වාර්තාව සහ අයවැය ලේඛන අනුව සමාලෝචිත වර්ෂයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 27 දරන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩල පනතට අනුව මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කළ හැකි පහත දැක්වෙන කාර්යයන් සංයුක්ත සැලැස්ම සැකසීමේ දී අවධානය යොමු වී නොතිබුණි.

- මණ්ඩලය විසින් ප්‍රවාහනය කරනු ලබන මගීන් සඳහා බස් නැවතුම්පලවල් හෝ ආවරණ සැපයීම.

- ප්‍රායෝගික නොවන හෝ දුෂ්කර බවට මණ්ඩලය විසින් සලකනු ලබන මාර්ගවල බස් සේවා සැපයීම.
- මණ්ඩලයට අයත් බස් රථ නැවතුම් ස්ථාන සපයාදීම සහ නඩත්තු කිරීම.

(ආ) 2016 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව වර්ෂය තුළ ලබා කරගැනීමට බලාපොරොත්තු වූ ඉලක්ක සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

i) කිලෝමීටරයකට මාර්ග ලේඛන ආදායම රු. මිලියන 65.5 ක් ඉපැයීමට ඉලක්ක කර තිබුණද 2016 වර්ෂය තුල තත්‍ය වශයෙන් උපයා තිබුණේ, කිලෝමීටරයකට මාර්ග ලේඛන ආදායම රු. මිලියන 57.59 ක් පමණි. ඒ අනුව ඉලක්කගත ආදායමෙන් රු. මිලියන 7.91 ක ආදායම් ලබාකර ගැනීමට නොහැකි වී තිබුණි.

ii) ක්‍රියාකාරී සැලැස්ම අනුව 2016 වර්ෂයේදී දිනකට ඉපැයීමට අපේක්ෂිත සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම රු.මිලියන 87.06 ක් වුවත්, වර්ෂය තුල තත්‍ය වශයෙන් දිනකට උපයන ලද සාමාන්‍ය මාර්ග ලේඛණ ආදායම රු.මිලියන 71.08 ක් වේ. මේ අනුව රු. මිලියන 15.98ක ඉලක්කයක් ලබාකර ගැනීමට නොහැකි වී තිබුණි.

(ඇ) පූර්ණ වශයෙන් අළුත්වැඩියා කළ යුතු බස් රථ හා දෛනිකව ඇතිවන සුළු අළුත්වැඩියා හේතුවෙන් ධාවනයෙන් ඉවත්වන බස් රථ අළුත්වැඩියා කර ධාවනයට එක් කිරීමට අරමුණු කර තිබුණද, 2016 දෙසැම්බර් 31 දිනට පැවති මුළු බස් රථ ඇණිය 7,768 ක් වුවද පහත දැක්වෙන හේතු මත එම බස් රථ ඇණියෙන් බස් රථ 1,564 ක් හෙවත් සියයට 20 ධාවනය කිරීමට නොහැකි තත්ත්වයේ පැවතුණි.

| විස්තරය | ධාවනය නොවන බස්රථ සංඛ්‍යාව |
|---|---|
| ටයර්, ටියුබ් සහ බැටරි නොමැතිව නතර වූ බස් රථ | 111 |
| කට්ටල්, උපකට්ටල් නොමැතිව නතර වූ බස් රථ | 424 |
| තඩාග සිදුවෙමින් පවතින බස් රථ | 85 |
| හදිසි අනතුරු අළුත්වැඩියාවේ පවතින බස් රථ | 55 |
| ධාවනය වීමේ දී ඇතිවන සුළු කාර්මික දෝෂ නිසා අළුත්වැඩියාවේ පවතින බස් රථ | 218 |
| කට්ටල් අළුත්වැඩියාවේ පවතින බස් රථ | 254 |
| විශාල අළුත්වැඩියා සඳහා නතර වී ඇති බස් රථ | 306 |
| අළුත්වැඩියාවෙන් ආර්ථික වාසි නොවන බස් රථ | 111 |
| **මුළු එකතුව** | **1564** |

බස් රථ වලින් 535 ක් ටයර්, ටියුබ් හා කට්ටල් නොමැතිවීම හේතුවෙන් ධාවනයට යොදවා නොතිබුණි. එමෙන්ම එම බස්රථ ඇණියෙන් 1008 ක් අවුරුදු 15කට වඩා පැරණි බස් රථ විය.

(ඈ) මණ්ඩලයේ 2016 වර්ෂය තුළ ධාවනයට ලබාදෙන බස් රථවලට අවශ්‍ය රියදුරු සංඛ්‍යාව (කාර්යයන් අනුව) 9,192 ක් හා කොන්දොස්තර සංඛ්‍යාව 9,192 ක් විය. සත්‍ය වශයෙන් සිටින රියදුරු සංඛ්‍යාව 9,954 ක් හා කොන්දොස්තර සංඛ්යාව 9,628 ක් විය. ඒ අනුව ධාවනයට ලබාදෙන ලද බස් රථවලට අවශ්‍ය රියදුරු සංඛ්‍යාව 762 ක් ද, කොන්දොස්තර සංඛ්‍යාව 436 ක් අතිරික්තව සිටින බව නිරීක්ෂණය වු නමුත් ප්‍රාදේශික හා ඩිපෝ අතර, අනුයුක්ත කිරීමේ විෂමතාවන් හේතුවෙන් ඇතැම් ප්‍රාදේශික වල හා ඩිපෝවල රියදුරු හා කොන්දොස්තර ඌනතා හා අතිරික්තතා පවතින බව නිරීක්ෂණය විය.

(ඉ) භාණ්ඩාගාර ප්‍රතිපාදන මත බස් රථ පුනරුත්ථාපනය කර රථ ඇණියට එක් කිරීමේ ව්‍යාපෘතිය සඳහා 2016 වර්ෂයට රු. මිලියන 800 ක් වෙන්කර තිබුණු අතර 2016 වර්ෂය තුළ දී රු. මිලියන 1084 ක් භාණ්ඩාගාරයෙන් ලැබී වියදම් කර තිබුණි. මණ්ඩලයේ සැලසුම් අංශයේ වාර්තා අනුව ඉලක්කගත ප්‍රමාණයෙන් බස්රථ 1539 ක් හෙවත් සියයට 65 ක් අළුත්වැඩියා කරගත නොහැකි වී තිබුණි. අපේක්ෂිත ඉලක්කයන් ලඟා කර ගැනීම පිළිබඳව විස්තරාත්මක තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | 2016 වර්ෂය<br>ඉලක්කය | සත්‍ය තත්ත්වය | ලඟාකර ගැනීමට නොහැකි වූ ප්‍රමාණය |
|---|---|---|---|
| එන්ජින් කට්ටල් | 1200 | 419 | 781 |
| ගියර් පෙට්ටි | 900 | 195 | 705 |
| බස් බොඩි | 264 | 211 | 53 |
| **එකතුව** | **2364** | **825** | **1539** |

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මධ්‍යම බස්රථ නැවතුම්පළ කාර්යාලයේ කඩ කාමර බදු දීම සම්බන්ධයෙන් වූ කඩ කුලී බදු ගිවිසුම්හි 14 හා 16 වගන්ති ප්‍රකාරව බදු දීමනාකාර පක්ෂය විසින් මාසික බදු මුදල් ගෙවීම එක දිගට මාස 3 කට පැහැර හැරියහොත් මාස 3ක පූර්ව ලිඛිත දැනුම් දීමක් කොට එම බදුගිවිසුම අවලංගු කළ හැකිය. නමුත් මධ්‍යම බස් රථ නැවතුම්පළ කාර්යාලයේ එල් එච් 32 හා එල් එච් 34 දරණ කඩ කාමරය හා වැසිකිළි පද්ධතිය වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් රු.450,000 ක් හා රු. 1,978,000 ක බදු මුදල් හිඟව පැවති අතර, වර්ෂය තුළ දී එක දිගට මාස 3 කට වඩා කුලී මුදල් පැහැර හැර තිබුණ ද ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මධ්‍යම බස්රථ නැවතුම්පළ කාර්යාලයේ කඩ කාමර 58 කින් 9ක් සඳහා පමණක් 2016 දෙසැම්බර් 31 දින වන විට බදු ගිවිසුම් වලංගුව තිබුණු අතර ඉතිරි බදු කුලී ගිවිසුම් යල් පැනගිය ඒවා බවත් ඒවායින් සමහර ගිවිසුම් 1970 වර්ෂයේ සිට පැවත එන බවත් නිරීක්‍ෂණය විය. මෙම බදු ගිවිසුම් යාවත්කාලීන කිරීම සඳහා මණ්ඩලය පියවර ගෙන නොතිබුණි.

(ඇ) විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව 2016 වර්ෂයේ මාසික කඩ කාමර කුලී මුදල් විවිධ රේටයන් යටතේ 2016 සැප්තැම්බර් 08 දිනැති අංක 61 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි සංශෝධනය කර තිබුණු අතර ඒ අනුව එම සංශෝධිත කුලී අය නොවන බවත්, නව මාසික කුලී ගාස්තුව තීරණය කිරීමේදී නිශ්චිත ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය . 2015 දෙසැම්බර් 31 දිනට පැවති මාසික කුලී මුදල හා 2016 දෙසැම්බර් 31 දිනට පැවති මාසික කුලී මුදල අතර විචලනය සියයට 0 සිට සියයට 403 ක් දක්වා පැවතුණි.

(ඈ) විදුලි බල මණ්ඩලය හා ජල සම්පාදන මණ්ඩලය විසින් සැපයුම් සඳහා ගාස්තු අය කිරීමේ ප්‍රතිපත්තියට අනුව භාවිතා කරන ඒකක ප්‍රමාණය වැඩි වන විට වැඩි රේටයකින් ගෙවීම් කිරීමට සිදු වේ.ඒ පිළිබඳව නොසලකා මධ්‍යම බස් රථ කාර්යාලය විසින් බදු දී ඇති කඩ කාමර සඳහා සවි කර ඇති උප ජල හා උප විදුලි මීටර් මගින් භාවිතා කරන ඒකක සඳහා සමාන රේටයක් යටතේ බදුකරුවන්ගෙන් ගාස්තු අය කර තිබුණි.මේ හේතුවෙන් පහත සඳහන් පරිදි 2016 වර්ෂය සඳහා ජල හා විදුලි බිල්පත් වශයෙන් බදුකරුවන්ගෙන් අය කළ ගාස්තු වලට වඩා රු.12,117,837ක් මණ්ඩලය විසින් ගෙවීම් කර තිබුණි.

| | 2016 වර්ෂයේ බදුකරුවන්ගෙන් අයකළ මුදල | 2016 වර්ෂයේ මණ්ඩලය ගෙවූ මුදල | 2016 වර්ෂයේ අයකළ මුදලට වඩා ගෙවා තිබුණු මුදල |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| විදුලිය | 2,520,495 | 9,156,041 | 6,635,546 |
| ජලය | 1,197,133 | 6,679,424 | 5,482,291 |
| එකතුව | 3,717,628 | 15,835,465 | 12,117,837 |

(ඉ) මධ්‍යම බස් රථ නැවතුම්පළ කාර්යාලයේ අංක එල්එච් 32 දරන කඩ කාමරය වර්ග අඩි 4,788 කින් යුක්ත විය. බදුකරු විසින් එය වායුසමනය කරන ලද කාමර 10 ක් පවත්වාගෙන යාම සඳහා භාවිතා කර තිබුණි. ඒ ස්ථානයට ලබා දී තිබූ තෙකලා විදුලි සැපයුම සඳහා 2016 වර්ෂයේ අයකර තිබූ විදුලි ගාස්තුව රු.175,815 ක් වුවත් , එහි විදුලි බිල්පත වශයෙන් මණ්ඩලය කොපමණ මුදලක් ගෙවා තිබුණි ද යන්න හඳුනා ගත නොහැකි වූ අතර මෙම අවාසිදායක ගාස්තු ප්‍රතිපත්ති හා ගිවිසුම්ගත කොන්දේසි සංශෝධනයට පියවර ගෙන නොතිබුණි.

(ඊ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අක්‍රිය ගිණුම් ශේෂ කපා හැරීම සඳහා කමිටුවක් පත් කිරීමට 2016 ජනවාරි තීරණය කර තිබුණි.ඒ සඳහා අමාත්‍යාංශ හා භාණ්ඩාගාර නියෝජිතයෙකු පත් කිරීම 2017 ජනවාරි දක්වා වර්ෂයක් ප්‍රමාද වී තිබුණු අතර 2018 අප්‍රේල් අවසන් වන විටත් අදාළ කමිටුව විසින් ඒ සඳහා වූ නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

(උ) ලංසු ලේඛනවල සඳහන් අතිරේක අවශ්‍යතා යටතේ ටයර් සපයන ආයතනය විසින් ටයර්වල නිෂ්පාදිත අනුක්‍රමික අංකය සඳහන් කළ ටයර් කාඩ්පතක් සෑම ටයරයක් සඳහාම ශ්‍රී ලංගමය වෙත නිකුත් කළ යුතු වුවද 2016 වර්ෂය සඳහා සියැට් සමාගමෙන් මිලදී ගත් ටයර් 19,094 ක් වෙනුවෙන් ටයර් කාඩ්පත් සපයා නොතිබුණි.

(ඌ) මණ්ඩලය විසින් 2016 වර්ෂය සඳහා ටයර් මිලදී ගැනීමට සියැට් කැලණි ජාත්‍යන්තර ටයර් සමාගම සමග 2016 මැයි 06 දින ගිවිසුමකට එළැඹ තිබූ අතර ඉන් පරිබාහිරව වෙනත් සමාගම් වලින් රු. 2,071,847ක් වටිනා නව ටයර් 34ක්, කරපටි 1925ක් හා ටියුබ් 195ක් මිලදී ගෙන තිබුණි.

(එ) ඩිපෝවලට අයත් බස් රථ සඳහා අවශ්‍ය අමතර කොටස් මිලදී ගැනීමේදී ප්‍රධාන කාර්යාල මගින් සැපයුම්කරුවන් තෝරාගෙන පසුගිය වර්ෂයන්හිදී ගෙවීම් සිදුකර තිබුණි. එහෙත් සැපයුම්කරුවන් විසින් ඩිපෝ වෙත සපයා තිබූ අමතර කොටස්වලට අදාල ඉන්වොයිස්පත් හා ඩිපෝ ගබඩාවට භාණ්ඩ ලද බවට සහතික, ඩිපෝ විසින් ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් මිලදී ගැනුම් අත්තිකාරම් ගිණුමෙහි 2015 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ශේෂය රු.1,907,294,471 හා 2016 දෙසැම්බර් 31 දිනට රු. 1,635,847,558 ක් වශයෙන් නොපියවූ ශේෂයක් වූ අතර අත්තිකාරම් නිරවුල් කිරීම ප්‍රමාදයකින් තොරව සිදු නොවන බව විගණනයට නිරීක්ෂණය විය.

(ඒ) ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ නිල වාහන ලොග්පොත්, Repair Kit Injector Pump ඇතුලුව ගබඩා අයිතම 140 ක් පාවිච්චි කිරීමට සුදුසු වුවද කලාතුරකින් නිකුත්වන භාණ්ඩ ලෙස 2016 දෙසැම්බර් 31 දිනට වූ ගබඩා සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව හඳුනාගෙන තිබූ අතර එහි වටිනාකම රු. 17,159,995 ක් විය. 2016 දෙසැම්බර් 31 දිනට පිළියෙල කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳව හෙළිදරව්කර නොතිබුණි.

(ඔ) ප්‍රධාන කාර්යාලයේ පමණක් විවධ අරමුණු වෙනුවෙන් ජංගම ගිණුම් 21 ක් පවත්වාගෙන ගොස් තිබුණු අතර හර එකතුව රු.6,822,431,518 ක් හා බැර එකතුව රු.6,815,368,696 ක් වශයෙන් ගිණුම් අතර මුදල් හුවමාරුකර තිබුණි. ඒ අනුව මූල්‍ය කටයුතු පිළිබඳ අභ්‍යන්තර පාලනය දුර්වල වී තිබුණු බව නිරීක්ෂණය විය.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කතරගම විශ්‍රාම ශාලාවේ අදියර 02 හි ඉදිකිරීම් පිරිවැය රු. 13,167,038 ක් වූ අතර එම ඉදිකිරීම් පිරිවැයෙන් රු. 7,912,368 ක් ගෙවා තිබියදී කොන්ත්‍රාත්කරු ඉදිකිරීම් කටයුතු අතර මග නවතා දමා තිබුණි. කෙසේ වුවද, කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාරව රු. 658,351 ක කාර්යසාධන බැඳුම්කරය 2013 දෙසැම්බර් 08 දින කල් පිරී තිබුණු අතර එය කල් පිරීමට පෙර මුදල්කර නොගැනීම නිසා ආයතනයට සිදු වූ පාඩුව සම්බන්ධව අදාල නිළධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රියදුරු පුහුණු පාසල් වාර්ෂිකව පාඩු ලබමින් පවත්වාගෙන ගොස් තිබුණි. ඒවා සඳහා රියදුරු උපදේශකයින්ට සාපේක්ෂව අනිකුත් කාර්ය මණ්ඩලය අතිරික්ත ලෙස අනුයුක්ත කර තිබුණි. ඒ හේතුවෙන් එම රියදුරු පුහුණු පාසල්වල ආදායම ඉක්මවා වැටුප් හා දීමනා ගෙවීමට සිදු වී තිබුණි. පොතුහැර හා කළුතර රියදුරු පුහුණු පාසල්වල 2016 වර්ෂයේ ආදායම , වැටුප් ගෙවීම හා අනුයුක්ත නිලධාරින් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රියදුරු පුහුණු පාසල පොතුහැර | රියදුරු පුහුණු පාසල කළුතර |
|---|---:|---:|
| 2016 වර්ෂයේ අලාභය රු. | 21,192,032 | 32,629,646 |
| 2016 වර්ෂයේ ආදායම රු. | 8,769,875 | 7,617,748 |
| 2016 වර්ෂයේ වැටුප් හා දීමනා ගෙවීම් රු. | 14,077,682 | 21,494,112 |
| අනුයුක්ත මුළු කාර්ය මණ්ඩලය | 21 | 33 |
| අනුයුක්ත කාර්ය මණ්ඩලයේ සිටින උපදේශකවරු සංඛ්‍යාව | 04 | 06 |

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පිරිවැය රු.97,462,160 ක් වු බස්රථ 143 ක් 2002 වර්ෂයේදී වෙස්කෝ ආයතනයට පුනරුත්ථාපනය කිරීම සඳහා යවා තිබුණි. එහෙත් වෙස්කෝ ආයතනය මේ වන විට ක්‍රියාත්මක තත්ත්වයක නොපවතින බැවින් අදාළ බස්රථ නැවත මණ්ඩලයට ගෙන්වා ගැනීම පිළිබඳ අවදානමක් පැවතියද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒ පිළිබඳ ප්‍රමාණවත් හෙළිදරව් කිරීමක් සිදුකර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ තොරතුරු අනුව 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා රු.3,695,712,194 ක් සේවක අර්ථසාධක අරමුදලට සේවක දායක මුදල් වශයෙන් සේවක වැටුපෙන් අයකර ඇතත් එම මුදල් නියමිත පරිදි සේවක අර්ථසාධක අරමුදල වෙත ප්‍රේෂණය නොකිරීම නිසා අදාළ කාලයට ලැබිය යුතු පොළී ප්‍රමාණය සේවකයන් වෙත ලැබී නොතිබුණි.

**4.5 දෘශ්‍ය අක්‍රමිකතා**

2012 සිට 2015 වර්ෂය දක්වා සමාගමක් විසින් ශ්‍රී ලංගමය සතු ඩිපෝ සඳහා නැප්කෝ නාමය යටතේ නිෂ්පාදිත දුනුකොළ සැපයුම්කරුවන් විසින් මණ්ඩලයට සපයා නොතිබියදී සැපයුම් කර ඇතිබව සඳහන් කරමින් එම ආයතනයට අයවිය යුතු මුදල් ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීම අනුව මණ්ඩලය විසින් රු. 127,150,000 ක ගෙවීම්කර තිබුණි. මුදල් රෙගුලාසි 137 හා 138 පරිදි දුනු කොළ ලැබුණු බව තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම්කර ඇතත් අදාල නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කිරීමට හා අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.6 ආර්ථික නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 හා 2015 වර්ෂ වල කල්බදු පදනම මත මිලදී ගන්නා ලද එක් බස්රථයක් සඳහා දිනකට රු.3,000 බැගින්, ඩිපෝ වෙතින් ප්‍රධාන කාර්යාලයට මුදල් ප්‍රේෂණය කල යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට ඩිපෝ වෙතින් රු. 1,541,834,030 ක මුදලක් ලැබිය යුතුව තිබුණි.

(ආ) ඩිපෝ විසින් මුදල් නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් ප්‍රධාන කාර්යාලය විසින් බස්රථ කල්බදු වාරික ගෙවීම ප්‍රමාද කර තිබූ අතර, ඒ සඳහා රු.67,076,082ක මුදලක් ප්‍රමාද ගාස්තු වශයෙන් ගෙවීමට සිදුවී තිබුණි.

(ඇ) කල්බදු වාරික හා ප්‍රමාද ගාස්තු ගෙවීමට ප්‍රමාණවත් මුදල් මණ්ඩලයේ නොතිබීම නිසා 2016 වර්ෂය තුලදී රු. 770,542,961 ක ණය මුදලක් ලබාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ ණය සඳහා පොලී වශයෙන් මණ්ඩලය විසින් රු.43,587,110 ක මුදලක් ගෙවා තිබුණි.

**4.7 හඳුනාගන්නා ලද පාඩු**

සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල වෙත දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂයේ අවසානයට පිළිවෙලින් රු.143,942,364 ක් හා රු.3,798,120 ක අධිභාර මුදලක් ගෙවීමට සිදුවී තිබුණි.

**4.8 කාර්ය මණ්ඩල පරිපාලනය**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9 වෙනි පරිච්ඡේදයට අනුකූලව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා සංවිධාන සටහනක්,බඳවා ගැනීමේ පරිපාටියක් හා උසස්වීම් පරිපාටියක් පිළියෙල කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගෙන නොතිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

**5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ මාස 11 ක් ප්‍රමාද වී එනම් 2018 ජනවාරි 23 දිනයේදීය.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සැලසුම් කරන ලද කාලය තුළ අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීමට හැකිවන පරිදි කළමනාකරණයේ වගකීම පැහැදිලිව හඳුනාගෙන ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කළ යුතු වුවද ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්ම මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට ගැනීමකින් තොරව ළඟා කරගත නොහැකි අරමුණු හා ඉලක්ක ඇතුළත් කර පිළියෙල කර තිබුණි.

## 5.3 ප්‍රසම්පාදන සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය පරිදි මණ්ඩලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද,4.2.1 (ආ) පරිදි අවම වශයෙන් වසර 3 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවද ඉදිරිපත් කරන ලද ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම ඊට අනුකූලව සකස් කර නොතිබුණි.

(ආ) 2016 ප්‍රසම්පාදන සැලැස්මට අනුව පහත පරිදි ටයර් මිලදී ගැනීමට සැලසුම් කර තිබුණද තථ්‍ය මිලදී ගැනීම හා සැසඳීමේදී ටයර් අඩුවෙන් මිලදීගෙන තිබූ අතර එය සියයට 56 සිට සියයට 100 දක්වා පරාසයක තිබුණි.

| ටයර් වර්ගය | ප්‍රසම්පාදන සැළැස්ම අනුව ටයර් සංඛ්‍යාව | සත්‍ය තත්ත්වය ටයර් සංඛ්‍යාව | වෙනස | වෙනස ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 750x16 | 72 | - | 72 | 100 |
| 825x20 | 4,800 | 1,074 | 3,726 | 78 |
| 900x20 | 36,000 | 15,924 | 20,076 | 56 |
| 1000x20 | 912 | 202 | 710 | 78 |
| එකතුව | **41,784** | **17,200** | **24,584** | |

## 5.4 අයවැය ලේඛනමය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් 2016 වර්ෂයට පිළියෙල කර තිබූ අයවැය ලේඛනයේ තොරතුරු හා 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන තොරතුරු සැසඳීමට නොහැකි පරිදි එකිනෙකට වෙනස් ආකාරයට පිළියෙල කර තිබුණි. ඒ අනුව මණ්ඩලය විසින් අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර විචලනයන් පවතින්නේ ද යන්න සොයා බැලීමක් සිදු නොකරන බවට හා එය ආයතනයේ මූල්‍ය කටයුතු පාලනය කිරීම සඳහා කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා නොගන්නා බවට නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ ආදායම් සහ වියදම් අයිතමයන් 15 ක අයවැයගත වටිනාකම් සහ තථ්‍ය වටිනාකම් අතර සියයට 11 සිට සියයට 101 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.5 පාරිසරික හා සමාජ වගකීම ඉටුකිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව, 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 23 වගන්තියට අනුව දූෂණයට මග සලසමින් පරිසරයට අපද්‍රව්‍ය පිටමං කිරීමත්, තැන්පත් කිරීමත් හෝ මෝචනය කිරීමෙන් කෙරෙන සෑම කටයුත්තක් සඳහාම ඉහත වගන්තිය යටතේ බලපත්‍රයක් ලබා ගත යුතු වේ. එම ගැසට් පත්‍රය ප්‍රකාරව ශ්‍රී ලංකාවේ භාවිතා කරනු ලබන සෑම මෝටර් වාහනයක්ම වායු විමෝචන පරීක්ෂාවට ලක් කර අනුකූලතා සහතිකයක් ලබා ගත යුතු වන අතර නියෝග අංක 09 ට අනුව මෝටර් වාහනය යන්නට බස්රථ ද ඇතුළත් වන බව සඳහන් වී ඇති බැවින් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බස්රථ සඳහාද වායු විමෝචන සහතික ලබාගත යුතු වුවත් ප්‍රාදේශීය කාර්යාල 10 ක තොරතුරු අනුව 2016 වර්ෂයේ මුළු බස්රථ 6729 කින් බස්රථ 800 ක් පමණක් වායු විමෝචන සහතික ලබා ගෙන තිබුණි. ඒ අනුව මුළු බස්රථ සංඛ්‍යාවෙන් සියයට 88 ක් දුම් සහතික ලබා ගැනීමකින් තොරව ධාවනය කිරීම නිසා පාරිසරික නීති රෙගුලාසි උල්ලංඝනය වී තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) සියලුම වාහන සේවා කටයුතු සිදු කරන ඩිපෝ විසින් ඊට අදාළව බලපත්‍රයක් ලබා ගත යුතු බව 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් හා 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතට අනුව දක්වා තිබුණද, ශ්‍රී ලංගමයේ ඩිපෝ 107 කින් ඩිපෝ 07 ක පමණක් මෙම බලපත්‍රය ලබා ගෙන තිබුණු බව නිරීක්‍ෂණය විය.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | මණ්ඩලයේ බස් රථවල විස්තර ඇතුළත් ලේඛනයක් පවත්වා නොගැනීම. |
| | | (ii) | වත්කම්වල ආරක්ෂාව ඇතිවන පරිදි භාරකාරත්වය නොපැවරීම. |
| | | (iii) | වත්කම් මිලට ගැනීම හා ගිණුම්ගත කිරීමේ අභ්‍යන්තර පාලනය දුර්වල වීම. |
| | | (iv) | වාර්ෂික සත්‍යාපනයන් නොකිරීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මූල්‍ය පාලනය | (i) | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු නොකිරීම හා ගෙවිය යුතු මුදල් ගෙවීමට කටයුතු නොකිරීම. |
| | | (ii) | මුදල් අංශය විසින් අවශ්‍යතාවයකින් තොරව බැංකු ගිණුම් පවත්වාගෙන යාම |
| | | (iii) | නිවැරදි ලෙස  බැංකු සැසඳුම් පිළියෙළ නොකිරීම |
| (ඇ) | අත්තිකාරම් පියවීම | (i) | අත්තිකාරම් ලේඛන පවත්වා නොගැනීම |
| | | (ii) | ලබාගත් අත්තිකාරම් අදාළ කාර්යය නිමවූ විගසම පියවීමට කටයුතු නොකිරීම. |
| | | (iii) | වගකිව යුතු නිලධාරීයෙකු විසින් අධීක්ෂණය නොකිරීම. |
| | | (iv) | කාලීන සැසඳීම් හා පියවීම් නොකිරීම. |
| (ඈ) | ගබඩා පාලනය | (i) | ගබඩාවට ලැබෙන භාණ්ඩ වගකිව යුතු නිලධාරියෙකුගේ අධීක්ෂණයට ලක් නොවීම. |
| | | (ii) | දීර්ඝ කාලයක සිට පැවතෙන පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ ඉවත් කිරීමට කටයුතු නොකිරීම. |
| | | (iii) | ප්‍රධාන කාර්යාලයෙන් ඇණවුම් කර සැපයුම්කරුවන් විසින් ඩිපෝ වෙත සෘජුව ලබා දී තිබූ භාණ්ඩ පිළිබඳ තොරතුරු ප්‍රධාන කාර්යාලයට වාර්තා නොකිරීම හා සැසඳීම් නොකිරීම. |
| | | (iv) | ගබඩා දත්ත හා ඩිපෝවල දත්ත සැසඳීම් නොකිරීම. |